**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2020**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **මතය ව්‍යාවනය**

---

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 08 දරන මෝටර් ප්‍රවාහන (සංශෝධන) පනතේ 213ඇ(5) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාවනය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාවනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ශේෂයන් හා එදිනට ලෙජරයේ පැවති එම ශේෂයන් අතර රු.32,090,890ක නොසැසඳීම් පැවතිණි. තවද සමාලෝචිත වර්ෂය සඳහා ශේෂ පිරික්සුමක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් නොකෙරුණි. | වර්ෂය තුළ සිදුවන ගනුදෙනු ලෙජරයේ සටහන් කරන අතර ජර්නල් සටහන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇත. ජර්නල් සටහන් වර්ෂ අවසානයේ ලෙජරයේ පිටපත් කරන බැවින් නොසැසඳීම් නොපවතී. | මූල්‍ය ප්‍රකාශනවල හා ප්‍රභව ලියවිලිවල සඳහන් අගයන් එකිනෙකට සැසඳෙන ලෙස ගිණුම් පවත්වා ගැනීම. |
| (ආ) | භාණ්ඩාගාර බිල්පත් පොලී හා ස්ථාවර තැන්පත් පොලී ආදායමට අදාළව විගණනයේදී සිදුකළ ගණනය කිරීම් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අතර රු.313,877ක වෙනසක් පැවතුණි. | මුදල් පදනමින් ගිණුම්ගත කර ඇති අතර මින් ඉදිරියට උපචිත පදනමින් ගිණුම් සකස් කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඇ) | මෙහෙයුම් හා පරිපාලන වියදම් සඳහා මුදලින් දරන ලද වියදමට උපචිත වියදම් ගැලපීමෙන් පසුව ලබාගත් ශේෂය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ශේෂය අතර රු. 93,188ක වෙනසක් පැවතුණි. | - එම - | - එම - |

## 1.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877 (2) ඇ ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන වාර්තාවේ පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට පියවර ගැනීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,089,187ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,082,958ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,229ක වර්ධනයක් නිරීක්ෂණය විය. වාර්ෂික ආදායමේ රු.29,930,223ක අඩුවීමට වඩා මෙහෙයුම් වියදමේ රු.29,936,453ක අඩු වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 අංක 04 දරන මෝටර් වාහන (ත්‍යාග දිරිදීමනා අරමුදල) නියෝග මාලාවේ 03 (1) නියෝගය පරිදි ත්‍යාග හා දිරිදීමනා සඳහා සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් 04ක් දක්වා තිබුණි. එහෙත්, අරමුදල ආරම්භයේ සිටම ත්‍යාග සඳහා පැවති පහත සඳහන් ක්‍රියාකාරකම් 03 වෙනුවෙන් ගෙවීම් සිදුකර නොතිබුණු අතර, අරමුදලට ලද ආදායම දිරිදීමනා ලෙස කාර්ය මණ්ඩලය අතර බෙදාහැර තිබුණි. එම ක්‍රියාකාරකම් සඳහා ත්‍යාග ගෙවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන්නේ නම්, සාවද්‍ය ලෙස සිදු කරන වාහන සකස් කිරීම්, වාහනවලට සිදුකරන වෙනස්කම් ආදී දැ අවම කර ගැනීමේ හැකියාවක් පවතී.<br>(i) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් | සාවද්‍ය ක්‍රියා පිළිබඳ තොරතුරු ලබාදෙන පුද්ගලයින්ගෙන් තොරතුරු නොලැබීම නිසා මෙම මුදල් ගෙවීමට නොහැකි වී ඇත. | අරමුදලේ මූලික පරමාර්ථ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර කටයුතු කළ බව. |

තොරව යම් මෝටර් රථයක් සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, අළුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හා නිර්මාණය වෙනස් කිරීමේ නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු සපයන පාර්ශවයන් වෙත මුදල් ගෙවීම.

(ii) ඇතැම් සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම සඳහා තොරතුරු සපයනු ලබන හෝ එවැනි සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගැනීමේ යෙදී සිටින තැනැත්තන්ට ත්‍යාග මුදල් ගෙවීම.

(iii) ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීමක් අවශ්‍ය වන්නා වූ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා වර්ෂයකට රු. 50,000ක් නොඉක්මවන පරිදි මුදල් ගෙවීම

(ආ) ත්‍යාග හා විශේෂ ඇගයීම් වෙනුවෙන් මෝටර් රථ (අධිභාර) රෙගුලාසි කෙටුම්පත් කර 2017 මැයි 02 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් එවා තිබුණි. එහෙත්, මෝටර් වාහන පනත ප්‍රකාරව එලෙස නියෝග සකස්කර අධිභාර පැනවීම එම පනතේම තවත් වගන්ති කිහිපයක ප්‍රතිපාදනවලට පරස්පර වීම නිසා අදාළ නියෝග සකස්කර අධිභාර පැනවීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ ක්‍රීඩා හා ප්‍රශංසනීය ඇගයීම් සඳහා රු.200,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, එම කාර්යයන් ඉටුකර නොතිබුණු අතර අරමුදලේ මූලික අරමුණ වූ ත්‍යාග පිරිනැමීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වේ. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |